# බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

## <u>2022 වර්ෂය සඳහා ද්‍රව්‍ය හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්</u>

## <u>ලියාපදිංචි කිරිමේ දැන්වීම</u>

2022 වර්ෂය සඳහා පහත උප ලේඛනයේ සඳහන් භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරිමට 2021.12.31 දින දක්වා අයදුම්පත් බළන්ගොඩ ප්‍රාදේශිය සභාවේ සභාපති වන මා විසින් කැඳවනු ලැබේ.සැපයුම්කරුවෙකු හා කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමේදි පහත සඳහන් පරිදි ගාස්තු අයකරනු ලබන අතර අදාල ගාස්තු ගෙවමින් එක් අයෙකුට භාණ්ඩ කිහිපයක් යටතේ වුවද ලියාපදිංචි විය හැක.

| අනු අංකය | කාණ්ඩය | ලියාපදිංචි කිරිමේ ගාස්තුව |
|---|---|---|
| 01 | කාර්යාල ලිපි ද්‍රව්‍ය,පාරිභෝගික භාණ්ඩ,සනීපාරක්ෂක ද්‍රව්‍ය | 1500.00 |
| 02 | කාර්යාල යන්ත්‍ර සුත්ත්‍ර , ඡායා පිටපත් සහ වේලා සටහන් කිරිමේ යන්ත්‍ර,මුද්‍රණ යන්ත්‍ර | 1000.00 |
| 03 | කාර්යාල ලීබඩු හා වානේ භාණ්ඩ | 1500.00 |
| 04 | පරිගණක යන්ත්‍ර,පරිගණක මෘදුකාංග හා මුද්‍රණ තින්ත,ටෝනර්,කාර්ට්රිජ්,රිබන්. | 1500.00 |
| 05 | කර්මාන්ත ද්‍රව්‍ය (සිමෙන්ති,යකඩ,තීන්ත,ටයිල් ආදිය) | 1500.00 |
| 06 | ඉදිකිරිම් ද්‍රව්‍ය(ගල්,මෙටල්,වැලි.සැටලින්ලැලි ආදිය) | 1500.00 |
| 07 | රබර් සීල්,දින මුද්‍රා,කුසලාන,ප්ලාස්ටික්/විදුරු නාම පුවරු | 750.00 |
| 08 | ලේඛන හා බිල්පත් ආදිය මුද්‍රිත ද්‍රව්‍ය ලබාගැනිම හා මුද්‍රණ සිදුකිරිම් | 1500.00 |
| 09 | ඩිජිටල් බැනර්,ප්‍රින්ටින් හා ස්ටිකර් මුද්‍රණය | 1500.00 |
| 10 | රෙදි මත හෝ තහඩු මත අකුරු හෝ සිතුවම් නිර්මාණය කිරිම | 750.00 |
| 11 | විදුලි හා විද්‍යුත් උපකරණ (විදුලි පහන් ඇතුලු සියලු විදුලි අයිතමයන්) | 1500.00 |
| 12 | පුස්තකාල පොත් | 750.00 |
| 13 | ආදාහනාගාරය අලුත්වැඩියා හා සේවා කිරිම් | 750.00 |
| 14 | ටයර්, ටියුබ්, බැටරි හා ඒ ආශ්‍රිත සේවා | 1500.00 |
| 15 | භාෂා පරිවර්තන සේවා | 750.00 |
| 16 | මෝටර් රථ අමතර කොටස්( ට්‍රැක්ටර්,JCB,කැබ්,බවුසර්) | 1500.00 |
| 17 | මොටර් රථ අලුත්වැඩියා හා පින්තාරු වැඩ | 750.00 |
| 18 | වාහන සේවා කිරිම | 750.00 |
| 19 | කාර්යාල යන්ත්‍ර සුත්‍ර අලුත්වැඩියා හා සේවා කිරිම්( ෆැක්ස්,පරිගණක,ඡායාපිටපත් යන්ත්‍ර) | 1500.00 |
| 20 | අනතුරුදායක ගස් හා කාර්යාලීය අවශ්‍යතා මත ගස් කැපීම දැව කඳන් ඉරීම. | 750.00 |
| 21 | ඉහත සඳහන් නොවු වෙනත් අයිතමයන් (සඳහන් කරන්න) | 1000.00 |
| | **ඉදිකිරිම් කොන්ත්‍රාත්** | |
| 22 | රුපියල් 500000.00 අඩු කොන්ත්‍රාත් සඳහා | 1000.00 |
| 23 | රුපියල් 500,001.00 සිට 1,000,000.00 දක්වා | 1500.00 |
| 24 | රුපියල් 1,000,001.00 සිට 2,000,000,.00 දක්වා | 2000.00 |
| 25 | රුපියල් 2,000,001.00 වැඩි | 2500.00 |
| 26 | බල ප්‍රදේශයේ සමිති ලියාපදිංචිය | 1000.00 |

කොන්දේසි:-

01. සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත් කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අය විසින් අප කාර්යාලීය නිල වෙබ් අඩවියේ පළකර ඇති ආදර්ශ අයදුම්පත්‍රය හෝ ඒ අයුරින් සකස් කළ අයදුම්පත්‍රයක් මගින් 2021.12.31 දිනට පෙර "ලේකම්, බළන්ගොඩ ප්‍රාදේශීය සභාව, දිගදුර, බළන්ගොඩ" යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන්/තැපෑලෙන් හෝ අතින් රැගෙනවිත් භාරදිය හැකිය.

02. ලියා පදිංචි කිරිමේ ගාස්තුව වශයෙන් ඒ ඒ අයිතමයන් ඉදිරියෙන් දක්වා ඇති මුදල ගෙවිය යුතුය.

03. මෙම ගෙවීම "සභාපති, බළන්ගොඩ ප්‍රාදේශීය සභාව" නමට ලියන ලද චෙක්පතක් මගින් හෝ මුදල් ඇණවුමක් මගින් හෝ 2021.12.31 දිනට පෙර සභාවේ මුදල් කවුළුව වෙතට ගෙවීම් කළ හැකිය.

04.අයදුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරෙහි " 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරිම" යනුවෙන් සඳහන් කළ යුතුය.

05. කොන්ත්රාත්කරුවන් ලියාපදිංචි කිරිම, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ ICTAD ලියාපදිංචි කිරිමේ සහතිකය හෝ රජයේ පළාත් පාලන හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ලියාපදිංචි වී ඇති සාර්ථක කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් බාහිර කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ අයිතිය සභාව සතුය.

06. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සභාවේ අවශ්‍යතාවය පරිදි මිල ගණන් කැඳවන අතර,සේවා අවශ්‍යතාවය මත ඉන් බාහිරවද භාණ්ඩ හා සේවාවන් සපයා ගැනිමේ අයිතිය මෙම සභාව සතුය.

08.වැඩි විස්තර කාර්යාලීය වෙලාව තුල දුරකථන අංක 045-2287276 ඇමතීමෙන් සහ අයදුම්පත්‍රය www.balangoda.ps.gov.lk යන කාර්යාලීය නිල වෙබ් අඩවියට පිවිසිමෙන් හා කාර්යාලයට පැමිණ ලබාගත හැකිය.

2021.10.29 වන දින

බලංගොඩ ප්‍රාදේශීය සභාවේ දීය.

එම්.එම්.සුනිල් ප්‍රේමසිරි

සභාපති,

බලංගොඩ ප්‍රාදේශීය සභාව.